# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 9 දරන වී නිපදවන්නන්ගේ ඉතිරි කිරීම් පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1973 මාර්තු මස 16 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 9 දරන වී නිපදවන්නන්ගේ ඉතිරි කිරීම් පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 47/71.

**වී අලෙවි මණ්ඩලයට හෝ එහි බලයලත් මිලට ගන්නකුට විකුණනු ලබන වී වෙනුවෙන් නිපදවන්නකුට ගෙවිය යුතු වන මිලෙන් එක්තරා නියමිත අඩුකිරීමක් කිරීමටත් ඒ අඩුකිරීම ඒ නිපදවන්නාගේ නමින් පෞද්ගලික ඉතිරි කිරීම් ගිණුමකට බැර කිරීමටත් ඒ මණ්ඩලයට හෝ බලයලත් මිලට ගන්නාට බලය පැවරීම පිණිස ද ඒ ගිණුම් තබා ගත හැක්කේ කවර කොන්දේසි යටතේ දැයි නියම කිරීම පිණිස හා ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 9 දරන වී නිපදවන්නන්ගේ ඉතිරි කිරීම් පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේය.

*වී විකුණුම් මිලෙන් අඩු කිරීම.*

**2.** (1) 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ හෝ අන් කිසි ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද වී අලෙවි මණ්ඩලයට හෝ එහි යම් බලයලත් මිලට ගන්නකුට විකුණනු ලබන වී වෙනුවෙන් නිපදවන්නකුට ගෙවිය යුතු වන මුදලෙන් එසේ විකුණනු ලබන වී සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මුදලක් ඒ මණ්ඩලය හෝ ඒ බලයලත් මිලට ගන්නා විසින් අඩු කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) නිපදවන්නකුට ගෙවිය යුතු වන මුදල්වලින් (1) වන උපවගන්තිය යටතේ එසේ අඩුකර ගනු ලබන මුදල ඒ නිපදවන්නා නමින් ඉතිරි කිරීම් ගිණුමකට බැර කරනු ලැබීම පිණිස ඒ මණ්ඩලය හෝ ඒ බලයලත් මිලට ගන්නා විසින් ඒ නිපදවන්නා පදිංචි ප්‍රදේශය තුළ පිහිටි නියමිත බැංකුවක තැන්පත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි විධිවිධාන අනුව තැන්පත් කරනු ලැබ එක් එක් නිපදවන්නාගේ ඉතිරි කිරීම් ගිණුමෙහි බැරට ඇති ඒ මුදල් වෙනුවෙන් නියමිත ප්‍රමාණය අනුව පොලී ගෙවිය යුතු ය.

*අනුයෝජිතයින් පත්කිරීම.*

**3.** 2 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් සඳහා යම් නියමිත බැංකුවක් විසින් ස්වකීය අනුයෝජිතයා වශයෙන් යම් සංස්ථාවක් හෝ බැංකුවක් හෝ අන්කිසි බැංකු ආයතනයක් පත් කළ හැකි ය.

*ඉතිරි කිරීම් ආපසු ගෙවීමේ කාලය.*

**4.** නිපදවන්නකුගේ පෞද්ගලික ඉතිරි කිරීම් ගිණුමේ බැරට ඇති මුදල—

(අ) ඒ නිපදවන්නා පුරුෂයකු නම් ඔහු වයස අවුරුදු හැටට එළඹීමෙන් පසු හෝ ස්ත්‍රියක නම් ඇය වයස අවුරුදු පනස් පහට එළඹීමෙන් පසු :

එසේ වුව ද ඒ නිපදවන්නා පුරුෂයකු නම් මේ පනත ක්‍රියාත්මකවීමේ දිනයෙහි ඔහු වයස අවුරුදු හැටට එළඹ ඇත්තා වූ හෝ ස්ත්‍රියක නම් මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයෙහි ඇය

කේ 18744—10,261 (73/3)

වයස අවුරුදු පනස් පහට එළඹ ඇත්තා වූ අවස්ථාවක, 2 වන වගන්තිය යටතේ කරන ලද අඩුකිරීම් ඒ නිපදවන්නා සම්බන්ධයෙන් ප්‍රථම තැන්පත් කිරීම කළ දිනයේ සිට එක් ලිත් වර්ෂයක් ගතවීමෙන් පසුව පමණක් ගෙවිය යුතු වන්නේ ය ; නැතහොත්

(ආ) ඒ නිපදවන්නා වෘත්තිය වෙනස් වීමේ හේතුවෙන් මේ පනතේ අර්ථානුකූල නිපදවන්නකු ව සිටීම නතර වීමෙන් පසු ; හෝ

(ඇ) ඒ නිපදවන්නා වැඩෙහි යෙදීමට ස්ථිර ව හා සම්පූර්ණයෙන් අපොහොසත් බවට පත්වීමේ හේතුවෙන් නිපදවන්නකුගේ තත්ත්වයෙහි නියුක්තව සිටීම නතර වීමෙන් හා ඒ හේතුව නිසා ඔහු තවදුරටත් ඒ වැඩට නුසුදුසු බව ලියාපදිංචි වූ වෛද්‍යවරයකු විසින් සහතික කරනු ලැබීමෙන් පසු ; හෝ

(ඈ) තමා ශ්‍රී ලංකාවෙන් පිටව යන්නේ ආපසු නොපැමිණීමේ අදහසින් යයි නිපදවන්නා ලියවිල්ලකින් ප්‍රකාශ කරතහොත් ඒ නිපදවන්නා ශ්‍රී ලංකාවෙන් පිටව යාමේ දිනයට පෙර

කළ හැකි තාක් ඉක්මණින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

105 වැනි අධි.

මේ වගන්තියේ " ලියාපදිංචි වූ වෛද්‍යවරයකු " යන්නෙන් වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි කළ වෛද්‍යවරයෙක් අදහස් වේ.

ඇතැම් අවස්ථාවල දී නිපදවන්නකුගේ ඉතිරිකිරීම් ගිණුමේ බැරට ඇති මුදල් ගෙවනු ලැබිය හැකි තැනැත්තෝ.

5. නිපදවන්නකුගේ පෞද්ගලික ඉතිරි කිරීම් ගිණුමෙහි ඔහුගේ බැරට ඇති මුදලට ඔහු හිමිකම් ලැබීමට පෙර නිපදවන්නා මියගිය අවස්ථාවක දී හෝ ඒ මුදලට හිමිකම් ලැබීමෙන් පසුව නමුදු මුදල ලබා ගැනීමට පෙර ඔහු මියගිය අවස්ථාවක දී හෝ ඒ නිපදවන්නා මරණයට පත් වූ විටෙක මුදල් ගෙවිය යුතු කිසිදු නම් කළ තැනැත්තකු ඒ නිපදවන්නා විසින් පත් කර නොමැති අවස්ථාවකදී හෝ එක් නම් කළ තැනැත්තකු පත් කරනු ලැබ තිබී ඒ නම් කළ තැනැත්තා මිය ගොස් ඇති හෝ එක් නම් කළ තැනැත්තකුට වැඩි ගණනක් පත් කරනු ලැබ තිබී ඔවුන් අතුරින් යම් එක් අයකු මිය ගොස් ඇති අවස්ථාවකදී ඒ මුදල එයට නීත්‍යානුකූල හිමිකම් ඇති තැනැත්තාට ගෙවනු ලැබිය යුතු ය.

ඉතිරි කිරීම ආපසු ලබා ගැනීම සඳහා ඉල්ලීම.

6. නිපදවන්නා විසින් හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකු විසින් හෝ නියමිත ආකාරයෙන් ඉල්ලීමක් කළ යුතු වීම යම් නිපදවන්නකුගේ ඉතිරි කිරීම් ගිණුමේ ඔහුගේ බැරට ඇති මුදල ආපසු ලබා ගැනීමේ ඔහුගේ අයිතිවාසිකමෙහි කොන්දේසියක් වන්නේ ය.

ආකෘති.

7. මේ පනතේ කාර්යයන් සඳහා භාවිත කළයුතු ආකෘති අමාත්‍යවරයා විසින් කලින් කල නියම කළ හැකි අතර එසේ නියම කරනු ලබන යම් ආකෘතියක් කලින් කල සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම ද ඔහු විසින් කළ හැකි ය.

යම් නිපදවන්නකුගේ පෞද්ගලික ඉතිරිකිරීම් ගිණුමක බැරට ඇති මුදල අන් සතු කළ නොහැකි බව.
97 වැනි අධි.

8. නිපදවන්නකුගේ පෞද්ගලික ඉතිරි කිරීම් ගිණුමක බැරට ඇති යම් මුදලක් පිළිබඳ සෑම පැවරීමක් ම හෝ ගෙවීමකට යටත් කිරීමක් ම සහ එබඳු පැවරීමක් හෝ යටත් කිරීමක් කිරීමේ සෑම එකඟවීමක් ම ශූන්‍ය විය යුතු අතර නිසි බලය ඇති අධිකරණයක් විසින් එම නිපදවන්නා බුන්වතකු ලෙස විනිශ්චය කරන ලද අවස්ථාවක දී වස්තු භංගත්ව ආඥා පනතේ විධිවිධාන කෙසේ වුවද එවැනි කිසි ම මුදලක් ඒ නිපදවන්නාගේ ණය හිමියන් වෙනුවෙන් ක්‍රියාකරන යම් පැවරුම්ලාභියකුට නොයා යුතු ය.

9. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හා බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළයුතු අතර එසේ පළ කරනු ලබන දිනයේදී හෝ නියෝග යෙහි නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් අනනුමතියේ දිනයෙහි සිට පරිච්ඡින්න වූ සේ සලකනු ලබන අතර ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවන්නේ ය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"නිපදවන්නා" යන්නෙන් 1958 අංක 1 දරන කුඹුරු පනතෙහි අර්ථානුකූල අඳ ගොවියෙක්, ඉඩම් හිමි ගොවියෙක් හෝ ඉඩම් හිමියෙක් අදහස් වේ ; එහෙත් අමාත්‍යවරයා විසින් නියම කරන ලද මණ්ඩල හැර සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූ පුද්ගල මණ්ඩල ඉන් බැහැර වන්නේ ය :

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියමිත බව අදහස් වේ ;

"බලයලත් මිලට ගන්නා" යන්නෙන් 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතෙහි අර්ථානුකූල බලය පවරනු ලැබූ වී මිලට ගන්නෙක් අදහස් වේ ;

"වී අලෙවි මණ්ඩලය" යන්නෙන් 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද වී අලෙවි මණ්ඩලය අදහස් වේ.